
# ජනවරම ඇති ජනපතිලා 7ක් නොකළ දේ කිරීමට... ජන වරමක් නැති ජනපතිට



## 225 දෙනා වරම දුන්නොත්... 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කළොත්...

# රටට සිදුවන විපත...

1. 13 වැනි සංශෝධනය යනු පූර්ණ පෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කිරීමේ විභවය සහිත ව්‍යවස්ථා සංශෝධනයකි. එනම් අනාගත ඊළාම් රාජ්‍යයේ කළලය පිළිසිඳ ගැනීමකි. එම සංශෝධනය මගින් පරමාධිපත්‍ය බලය බෙදී යන ලෙස බලතල බෙදීමක් සිදුවන බැවින් ජාත්‍යන්තර නීතියට අනුව එම බලතල ක්‍රියාත්මක කිරීමට මධ්‍යම ආණ්ඩුව ඉඩ ලබා නොදේ නම් එම බල ඒකකයේ ජනතාවට වෙන්ව යාමේ අයිතිය ඇත. (නැගෙනහිර ටිමෝරය බෙදා වෙන් කිරීමට අදාළව ජාත්‍යන්තර අධිකරණයේ පෘතුගාලය එදිරිව ඕස්ට්‍රේලියාව නඩු තීන්දුව) ඊට අමතරව ව්‍යවස්ථාවේ ඒකීය යන වචනය මගින් ආරක්ෂාවක් ලැබෙන බවට මතයක් තිබුණද ඒකීය වචනය එසේම තිබියදී ෆෙඩරල් ව්‍යුහයක් ක්‍රියාත්මක විය හැකි බවට චන්ද්‍රසෝම එදිරිව සේනාධිරාජා නඩු තීන්දු මගින් ප්‍රකාශයට පත් වී ඇත.

2. නමුත් එදා 1987 දී එම සංශෝධනය සම්මත කරන අවස්ථාවේදී පැන නැගුන ප්‍රබල මහජන විරෝධය නිසා අදාළ සංශෝධන ජනමත විචාරණයකට යොමු කිරීමේ හැකියාවක් නොතිබූ බැවින් එම සංශෝධනයේ අඩංගු පූර්ණ ෆෙඩරල් බලතල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ නොහැකි වන ආකාරයට යම් ව්‍යවස්ථාමය බාධක ප්‍රමාණයක් පැනවීමට හැකිවිය.

3. එම බාධක ප්‍රධාන වශයෙන් ආණ්ඩුකාරවරයාගේ බලතල, ජාතික ප්‍රතිපත්ති මධ්‍යම ආණ්ඩුව විසින් තීරණය කිරීම, සමගාමී ලැයිස්තුව මගින් යම් බලතල වලට අදාලව මධ්‍යම රජයට ද නීති පැනවීමේ බලය ලබාදීම, ඉඩම් අන්සතු කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වීම මෙන්ම බලතල ක්‍රියාත්මක කිරීමට අදාළව ජාතික කොමිසන් සභා (ඉඩම්, මුදල්, පොලිස්, ආදී) මගින් පළාත් වලට යම් බලපෑමක් කිරීමේ හැකියාව ආදී වශයෙන් හඳුනාගත හැක. ඒ නිසා පසුගිය කාලය තුළ උතුර සහ නැගෙනහිර පළාත් වල පමණක් නොව සෙසු පළාත්වල ද සම්පූර්ණ ෆෙඩරල් පාලනයක දැකිය හැකි ලක්ෂණ දැකගත නොහැකි විය.

4. උදාහරණයක් ලෙස යම් පළාත් සභාවක් ව්‍යවස්ථාව මගින් ලබාදී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා එනම් පොලිස් ප්‍රඥප්ති, ඉඩම් ප්‍රඥප්ති ආදිය සම්මත් කිරීම සඳහා උත්සාහ කරන අවස්ථාවකදී ආණ්ඩුකාරයා මගින් එය වැළැක්වීමේ හැකියාව ඇත. ආණ්ඩුකාරයා මගින් ජනාධිපතිවරයා හරහා අදාළ ප්‍රඥප්ති මගින් ව්‍යවස්ථාව උල්ලංඝනය වන්නේ ද යන්න පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසීමේ හැකියාව ඇත. (කෙසේ වෙතත් මධ්‍යම රජයේ පනත් සම්මත කිරීමේදී මහජනයා විසින් අධිකරණයේ මතය විමසීමට හැකියාව ඇතත් පළාත් පඥප්තිය සම්මත කිරීමේදී මහජනයාට එවැනි බලයක් නැත.)

5. නමුත් පවතින ආණ්ඩුව සහ ජනාධිපතිවරයා 13වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමට ඉඩ දිය යුතුය යන දේශපාලන තීන්දුව ගනු ලබන්නේ නම් ව්‍යවස්ථා සංශෝධනයකින් තොරව පරිපාලන වශයෙන් අදාළ බාධක අතික්‍රමණය කිරීමේ හැකියාව ඇත. උදාහරණයක් ලෙස උතුරු පළාත් සභාව පලාත ඉඩම් ප්‍රඥප්තියක් සම්මත කිරීමේදී ඊට බාධා නොකරන ලෙස ආණ්ඩුකාරයාට දැන්වීමේ හැකියාව ඇති අතර අදාළ ප්‍රඥප්තිය මගින් ව්‍යවස්ථාව උල්ලංඝණය වෙනවා ද යන්න පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම නොකර සිටීමේ හැකියාව ඇත. බොහෝවිට බෙදුම්වාදයට පක්ෂපාතී ආණ්ඩුකාරවරයෙකු පත් කිරීම මගින් ජනාධිපතිවරයා මැදිහත් නොවී දේශපාලන වශයෙන් ඇඟ බේරා ගැනීමේ හැකියාව ඇත. මෑතකදී උතුර සහ නැගෙනහිර පළාත් වලට පත්කළ ආණ්ඩුකාරවරු අනුව අනාගතයේ දී එම උපක්‍රමය ක්‍රියාත්මක විය හැක. ඊට අමතරව පළාත් ඉඩම් ප්‍රඥප්ති අනුව කටයුතු කිරීම සඳහා ඉඩම් නිදහස් කිරීමේ බලය ද ජනාධිපතිවරයා සතු වන බැවින් එම කාර්යයද ඉටු කිරීමේ හැකියාව ඇත.

6. ඊට අමතරව සමගාමී ලයිස්තුවට අනුව මධ්‍යම රජය සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්මත නොකර සිටීම මගින් සහ පළාත් සභාවක් ඊට අදාලව ප්‍රඥප්තියක් සම්මත කිරීමේදී බාධා නොකර සිටීම මගින් 13 ට එරෙහිව පවතින බාධක පරිපාලන වශයෙන් ඉවත් කිරීමේ හැකියාව ඇත.

7. ඉහත සඳහන් කළ ආකාරයට 13 වැනි සංශෝධනය පරිපාලන වශයෙන් පූර්ණ ලෙස බලාත්මක කිරීම සඳහා ඊට පක්ෂපාතී ජනාධිපතිවරයෙකු බලයේ සිටිය යුතුය. වත්මන් ජනාධිපතිවරයා ඒ සඳහා සැදී පැහැදී සිටින බව ඉතා පැහැදිලිය. එසේම ඒ සඳහා මහජනයා එවැනි තත්ත්වයක් භාරගන්නා මනෝභාවයක සිටීම ද පූර්ව කොන්දේසියකි. වත්මන් ආර්ථික අර්බුදය හමුවේ දෙමළ ඩයස්පෝරාව ප්‍රමුඛ විවිධ ජාත්‍යන්තර හස්තයන් ක්‍රියාත්මක වීම මගින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා පළවා හැර එම කොන්දේසි දෙකම එක විට ඉටු කරනු ලැබුවේ ද යන ප්‍රශ්නය දැන් මතුවේ.

8. නමුත් ඉතිහාසයේ බොහෝ අවස්ථාවලදී සිදු වී ඇති ආකාරයට බහුතර සිංහල බෞද්ධ ජනතාව නැගී සිටීම මගින් ඉදිරි ජනාධිපතිවරණයේ දී වර්තමාන ජනාධිපතිවරයාට වේදිකාවෙන් බැස යාමට සැලසුව හොත් බෙදුම්වාදීන් විසින් නිර්මාණය කරගත් අවස්ථාව ඔවුන්ට අහිමි වේ. ඒ නිසා ජනාධිපතිවරණයට පෙර ව්‍යවස්ථා සංශෝධනයක් මගින් 13 ට එරෙහි බාධක ඉවත් කිරීම හෙවත් 13 සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන ව්‍යවස්ථාමය තත්ත්වය නිර්මාණය කරගැනීමට බෙදුම්වාදී බලවේග උත්සාහ කරති.

9. ඒ මගින් බෙදුම්වාදීන්ට ඉතා වාසි සහගත තත්ත්වයක් උදාවේ. එනම් ව්‍යවස්ථා සංශෝධනයකින් බාධක ඉවත් කිරීමෙන් පසුව වත්මන් ජනාධිපති නැවත බලයට පත් වුවවොත් ඊළාම් මාර්ග සිතියම ඉදිරි සැතපුම් කණු බාධාවලින් තොරව සීඝ්‍රයෙන් පසු කිරීමේ හැකියාව ලැබේ. යම් ආකාරයට බහුතර ජනතාව අවදි වී වත්මන් ජනාධිපති පරාජය කර බෙදුම්වාදයට පක්ෂපාතී නොවන ජනාධිපතිවරයකු බලයට පත් කළ ද ව්‍යවස්ථාමය බාධක ව්‍යවස්ථා සංශෝධනයක් මගින් ඉවත් කරන ලද තත්ත්වයක් යටතේ පළාත් සභා විසින් තම බලතල ක්‍රියාත්මක කරන විට එම ජනාධිපතිවරයාට අසරණව බලා සිටීමට සිදුවේ.

10. ඊට හේතුව ඉහත සඳහන් කළ ජාත්‍යන්තර නඩු තීන්දුව අනුව පරමාධිපත්‍ය බලය බෙදී යන ආකාරයට බලය බෙදා ඇති විටක එම බලය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම රජය ඉඩ නොදේ නම් එම ජනතාවට වෙන්වීමේ අයිතිය ඇත. ඒ අනුව ඉඩම් ප්‍රඥප්තිය සම්මත කර ඉඩම් බෙදා දීමේදී මධ්‍යම ආණ්ඩුව ඊට බාධා කළහොත් ජාත්‍යන්තර මැදිහත්වීමකට ඉඩ සැලසේ. විශේෂයෙන්ම සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම පිහිටුවන්නේ

ජාත්‍යන්තර නියෝජනයක් සහිතව වන බැවින් සහ එම කොමිසමට ප්‍රතිසන්ධානය යටතේ ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම හෙවත් බලය බෙදීමට අදාල ගැටලුවලට මැදිහත් වීමේ බලය ලැබේ.

11. එවැනි ජාත්‍යන්තර මැදිහත් වීමක දී ඉහත සඳහන් කළ ජාත්‍යන්තර අධිකරණ නඩු තීන්දුව අනුව බෙදුම්වාදීන් විසින් අමතර වාසිදායක තත්ත්වයක් ද නිර්මාණය කර කරගැනීමට උත්සාහ කරනු ඇත. එනම් මෙම නඩු තීන්දුවට අනුව බෙදී ගොස් ඇති පරමාධිපත්‍යය බලය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා නොදෙන්නේ නම් වෙන්ව යාමේ අයිතිය එම ජනතාවට ලැබෙන අතර එම ජනතාව සමූල ඝාතන ක්‍රියාවලියකට ගොදුරු වී සිටී නම් එම අයිතිය තවදුරටත් තහවුරුවේ. දෙමළ ඩයස්පෝරාව මැදිහත්වී කැනඩාවේ සමූලඝාතන සති පැවැත්වීම සඳහා නීති සම්මත කරන්නේ කුමක් නිසාදැයි ඒ මඟින් පැහැදිලි වේ.

12. ජාත්‍යන්තර මැදිහත් වීමක් සඳහා දැනටමත් ජාත්‍යන්තර මානව හිමිකම් කොමිසම හරහා තත්ත්වය නිර්මාණය කර ඇත. ඒ මගින් ප්‍රතිසන්ධානය යටතේ වගවීම වන්දි ගෙවීම සත්‍ය සෙවීම සහ ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම යන ක්‍රියාමාර්ග හතරට අදාළව බලපෑම් කරනු ලැබේ. ඒ අනුව ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා 13 වැනි සංශෝධනය බලාත්මක කළ යුතු බව දිගින් දිගටම බලපෑම එල්ල වූ බව රහසක් නොවේ. ඊට අමතරව ආරක්ෂක හමුදා ප්‍රධානීන්ට එරෙහිව යුද්ද අපරාධ චෝදනා එල්ල කරමින් චෝදනා සහ සාක්ෂි ගොනු කිරීමේ ජාත්‍යන්තර යාන්ත්‍රණයක් ද ක්‍රියාත්මක වේ. ඒ මගින් ආරක්ෂක හමුදා ප්‍රධානීන්ට මානසික බාධක පපැමිණ වීමට  හැකිවේ. ඒ බව ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහකිරීමේ ජාත්‍යන්තර මෙහෙයුමේ දී ආරක්ෂක හමුදා ප්‍රධානීන් ක්‍රියා කළ ආකාරය අනුව පැහැදිලි වේ. ඒ අනුව උතුරින් හමුදා කඳවුරු ඉවත් කිරීමට බලපෑම් කිරීමේදී සහ ඉඩම් පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමේදී ආරක්ෂක හමුදා ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීමේ හැකියාව ලැබේ. එහෙත් ජාත්‍යන්තර මැදිහත්වීමක් තුළ ආරක්ෂක හමුදා ප්‍රවේශමෙන් කටයුතු කරන තැනට තල්ලු කිරීමේ ඉඩකඩ දැන් ලැබී ඇත. ආරක්ෂක හමුදාවලට යුද්ද අපරාධ චෝදනා එල්ල කිරීමේ අවසන් අරමුණ එය බව ඒ අවස්ථාවේදී බලධාරීන්ට සහ මහජනයාට ප්‍රත්‍යක්ෂ වෙනු ඇත.

13. 2012 වසරේදී මඩකලපුවේ පැවැත්වූ ITAK  පක්ෂ සමුළුවේදී ආර්. සම්බන්ධන් මහතා සඳහන් කරන්නේ තමා ඊළාම් අරමුණු අත්හැර නැති බව සහ එම අරමුණු කරා ළඟා වීමට යුද්ධය වෙනුවට ගාන්ධිවාදී අවිහිංසාවාදී සටන් පාවිච්චි කරන බවය. එම අවස්ථාවේදී ජාත්‍යන්තර ප්‍රජාව තමාට සහාය දක්වනු ඇති බවට ඔවු විසින් විශ්වාසය පළකළ අතර ඒ සඳහා ආරාධනා කරන බව ද ඔහු විසින් සඳහන් කළේය. එහිදී ඔහු සඳහන් කළේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමෙන් පසුව එම බලතල බලාත්මක කිරීමට මධ්‍යම රජය ඉඩ ලබා නොදෙන්නේ නම් කලයුතු දේ බව ඉතා පැහැදිලිය.

14. මෙම ක්‍රියාවලිය තුළ ඉන්දියාවේ කොටස පිළිබඳව යම් දේශපාලන පක්ෂවලට වැරදි විග්‍රහයක් තිබෙන බව පෙනුනද ඉන්දියාවේ අවසන් අරමුණ සර්දාර් පනික්කාර් න්‍යාය බව ඉතා පැහැදිලිය. වෙනත් වචනවලින් කියන්නේනම් ශ්‍රී ලංකාවේ රාජ්‍ය දුරුවලකර ගිවිසුම් මගින් අර්ධ යටත් විජිතයක් බවට පත්කිරීමය. එනම් ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත් කිරීමය. එම ක්‍රියාවලිය අවසන් වන්නේ 30 වැනි ප්‍රාන්තය හෙවත් ඊළාම් රාජ්‍යයද නිර්මාණය කර එයද අර්ධ හෝ පූර්ණ යටත් විජිතයක් ලෙස ඈදා ගැනීම මගිනි.

15. එදා ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී සන්නද්ධ ව්‍යාපාරයට පුහුණුව, ආයුධ සහ මුදල් ලබා දී පෝෂණය කිරීමෙන් අනතුරුව එය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ රාජ්‍යය  දණ ගස්වා  1987 දී ඉන්දු-ලංකා සාමගිවිසුම නමින් යටත්වීමේ ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. අද ආර්ථික අපදාව යොදා ගනිමින් එම ක්‍රියාවලියේ කූටප්‍රාප්තිය ලෙස ආර්ථික ඒකාබද්ධකරණ ගිවිසුමකට වර්තමාන ජනාධිපතිවරයා පොළඹවනු ලැබීය. පසුගිය ජූලි 21 දින ඇතිකරගත් පස්වැදෑරුම් එකඟතාවය මගින් ශ්‍රී ලංකාව ඉන්දියාවේ ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීම සිදුවේ. එනම් 29 ප්‍රාන්තය නිර්මාණය වේ.

16. ඒ අනුව 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ එනම් පොලිස් ප්‍රඥප්ති, ඉඩම් ප්‍රඥප්ති, මහ ඇමති අරමුදල් ප්‍රඥප්ති, පළාත් පුරාවිද්‍යා අධිකාරි ප්‍රඥප්ති ආදී වශයෙන් ප්‍රඥප්තිය එකක් පසුපස එකක් බැගින් ප්‍රඥප්ති සම්මත කර ඒවා ක්‍රියාත්මක කිරීමේදී මධ්‍යම රජය සමග ඇතිවන

ගැටුම්වලදී නිර්මාණය වන අවස්ථාව භාවිතා කරමින් මැදිහත් වන ජාත්‍යන්තර පාර්ශව අතර ඉන්දියාව ප්‍රමුඛස්ථානය ගනු ලබන බවට සැකයක් නැත. ඒ වන විට ඉන්දියාව සහ උතුරු සහ නැගෙනහිර පළාත් අතර භූගෝලීය සබඳතාව ඇති කිරීම හෙවත් ධනුෂ්කොඩි සිට ඉන්දුයානු දුම්රිය මාර්ග පද්ධතිය මන්නාරම හා මැදවච්චිය හරහා ත්‍රිකුණාමලය දක්වා දීර්ඝ කිරීමේ ක්‍රියාවලිය සහ රාමේෂ්වරන් - තලේමන්නාරම් මහා මාර්ගය ඉදි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වී තිබෙනු ඇත. එම මාර්ග ජාත්‍යන්තර මාර්ග ලෙස නම් කෙරෙන අතර ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත ආයෝජන කලාපය තුළ ඉන්දියානු මැදිහත්වීම වර්ධනය කෙරෙනු ඇත. ඊට අමතරව රාජ්‍ය ආයතන මිලදී ගැනීම වරායවල යටිතල පහසුකම් සංවර්ධනය සහ ETCA ගිවිසුම අනුව භාණ්ඩ සහ සේවා වෙළෙඳපොළ ඇතුළු ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ප්‍රබල භූමිකාවක් ඉන්දියානුවන් විසින් අත්පත් කරගනු ඇත.

17. එම ක්‍රියාවලිය තුළ RSS වැනි හින්දු ආගමික අන්තවාදී කණ්ඩායම් විසින් උතුරු සහ නැගෙනහිර පළාත්වල දහස් ගණනක් වන බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම, හින්දු කෝවිල් ඉදිකිරීම, පුරාවිද්‍යා රක්ෂිත සහ වන රක්ෂිත මෙන්ම වනජීවී රක්ෂිත ආශ්‍රිතව ජනාවාස බිහි කිරීම ආදියට මැදිහත් වනු ඇත. ඒ තුළ ආගමික සහ ජාතිවාදී ගැටුම් ඇවිලවීමේ ප්‍රබල ඉඩක් ඇති අතර උතුරින් සිංහල ජනතාව පලවා හැරීම සහ පකිස්ථානය බෙදා වෙන් කිරීමේදී සිදු වූ ආකාරයට දකුණේ දෙමළ ජනතාවට උතුර සහ නැගෙනහිරට සංක්‍රමණය වීමේ තත්ත්වයක් ද නිර්මාණය කෙරෙනු ඇත. එම ආගමික ගැටුම් ද ජාත්‍යන්තර මැදිහත් වීමට අදාළ නිමිත්තක් බවට පත් කරනු ඇති අතර දීර්ඝකාලීනව ජාතිකත්ව අතර විරසකය උත්සන්න කෙරෙනු ඇත.

18. එහිදී ආරක්ෂක අංශ අකර්මණ්‍යව බලා සිටින හෙවත් මානසික බාධක පනවා ගනිමින් ක්‍රියා කරන තත්ත්වයක් තුළ සිවිල් ගැටුම් උත්සන්න කිරීම මගින් ජාත්‍යන්තර සාම සාධක හමුදාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආශිර්වාදය ඇතිව ස්ථානගත කිරීමට අවස්ථාව නිර්මාණය වේ. බොහෝ විට වත්මන් ජනාධිපතිවරයා ඒ වන විට බලයේ සිටින්නේ නම් එම අන්තයට ඉතා කෙටිකලකින් ළඟාවීමේ හැකියාව ලැබෙනු ඇත.

19. එහි අවසාන ප්‍රතිඵලය ලෙස උතුරු සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම මුවාවෙන් ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ පළාත් සභා විසින් ජාත්‍යන්තර ප්‍රජාවෙන් ඉල්ලා සිටීමේ හැකියාව ඇත. ඉන්පසු අන්තර්කාලීන පාලනයක් පිහිටුවා ඒ මගින් ඊළම හෙවත් වෙනම රාජ්‍යයක් ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ඇත. එම අන්තර්කාලීන ආණ්ඩුව ඉන්දියාවේ රූකඩ පාලනයක් බවට පත්වන බවට කිසිදු සැකයක් නැත. එම ආණ්ඩුව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට වඩා අඩියක් පෙරට තබා ආරක්ෂක වෙළඳ සහ ආයෝජන ගිවිසුම් මගින් අර්ධ යටත් විජිතය හෙවත් ඉන්දියාවේ 30 වැනි ප්‍රාන්තය නිර්මාණය කිරීමට කටයුතු කරන බවට සැකයක් නැත.

20. එම ක්‍රියාවලියි තුළ මහ ඇමති අරමුදල් ප්‍රඥප්තිය සම්මත කිරීම මගින් ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ බලය ඉක්මවා යන ආකාරයට ස්වාධීනව විදේශ විනිමය ගනුදෙනු කිරීමට සහ දෙමළ ඩයස්පෝරාව මගින් විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ආශ්‍රිතව මහා පරිමාණ ආයෝජන දිරිමත් කිරීම හරහා එම පළාත් වල දෙමළ ජනතාවගේ ආර්ථික ඉඩ ප්‍රස්ථා වර්ධනය කිරීම මගින් එම ජනතාවගේ ආශිර්වාදය ලබා ගැනීමට ඊළාම් රාජ්‍යයේ පාලකයන් කටයුතු කරනු ඇත. එහෙත් 65% ක් වන කුලහීන දෙමළ ජනතාව වෙල්ලාලයන් ගේ ආර්ථික වහලුන් බවට පත්වන බවට ද සැකයක් නැත. අවසානයේ දී දකුණේ පිරිස් ද පාස්පෝට් වල සීල් ගසාගෙන එම ආර්ථික අවස්ථා ලබා ගැනීමට පෙළ ගැසෙනු ඇත. අවසානයේදී උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ඉන්දියානු ක්‍රියාකාරිත්වය වර්ධනය වී සිකිමය ඈඳාගත් ආකාරයට ඊළාම් රාජ්‍යය තමිල්නාඩු ප්‍රාන්තයේ කොටසක් ලෙස ඈඳා ගැනීමේ හැකියාව බැහැර කළ නොහැක. එම සමස්ත ක්‍රියාවලිය තුළ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල මුස්ලිම් ජනතාවට ද විශාල අර්බුදයකට මුහුණ දීමට සිදුවනු ඇත.


# ජාතික සංවිධාන එකමුතුව

**අංක 31/14/ඒ, දෙවන පටුමග, කොස්වත්ත, නාවල.**